# ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
# පූර්ව ලංසු රැස්වීම - රැස්වීම් වාර්තාව

දිනය : 2023.11.20
වේලාව : පෙ.ව 10.30
ස්ථානය : ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරය
ව්‍යාපෘති :

- අවිස්සාවේල්ල තෙත් කලාපීය උද්භිද උද්‍යානයේ ආරක්ෂක සේවාව පවත්වාගෙන යාම 2024-2025
- ගම්පහ උද්භිද උද්‍යානයේ ආරක්ෂක සේවාව පවත්වාගෙන යාම 2024-2025
- හම්බන්තොට වියලි කලාපීය උද්භිද උද්‍යානයේ ආරක්ෂක සේවාව පවත්වාගෙන යාම 2024-2025
- පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ වැසිකිළි පවිත්‍රතා සේවාව සැපයීම 2024-2025
- හම්බන්තොට වියලි කලාපීය උද්භිද උද්‍යානයේ පවිත්‍රතා සේවාව 2024-2025
- පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ කිරිහල බදුදීම 2024-2025
- පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ කැෆටේරියා ආපන ශාලාව බදුදීම 2024-2025
- අවිස්සාවේල්ල උද්භිද උද්‍යානයේ සුභසාධන ආපන ශාලාව බදුදීම 2024-2025

2023.11.20 දින පෙ.ව. 10.30ට උක්ත ප්‍රසම්පාදනයන්ට අදාල පූර්ව ලංසු රැස්වීම ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේදී පහත නිලධාරීන්ගේ හා ලංසු නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් පැවැත්විය. සහභාගි වූ සාමාජිකයන්ගේ නම් පහත වේ.

**නිලධාරින්ගේ පැමිණීම**

1. වි.ජී.සි.එන් ගමගේ මිය - ප්‍රධාන ගණකාධිකාරි
2. එම්.එම්.ඩී.ජේ.සේනාරත්න මයා - අධ්‍යක්ෂ (සංවර්ධන),
3. ඒ.එම්.ඒ.එස් අත්තනායක මිය - අධ්‍යක්ෂ(තාක්ෂණ ප්‍රචාරණ හා පර්යේෂණ)
4. ආර්.එස්.ඩබ්.ගෝමස් මිය - නියෝජ්‍ය අධ්‍යක්ෂ (රාජකීය උ.උ)
5. එච්.ජී.ජයසේකර මයා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)
6. ටී.ජී.ඩී.කේ.වීරසිංහ මයා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)
7. පී.එස්.කේ.පලිහක්කාර මයා - සහකාර අධ්‍යක්ෂ (රා.උ.උ)
8. එල්.පී.කේ.වීරවර්ධන මිය - කළමනාකරණ සේවා නිලධාරි

**කොන්ත්‍රාත්කරුවන්ගේ පැමිණීම**

1. සහරා ක්ලිනින් සර්විස්
2. එස්.බී.ඩබ්ලිව් මැන්පවර් ඇන්ඩ් ජෙනිටෝරියල් සර්විස්
3. කේ.වයි.එස්.පවිත්‍රතා හා ආරක්ෂක සේවය
4. අල්ට්‍රාක්ලීන්(පුද්)සමාගම
5. ගෝල්ඩන් හාර්ට් සිකියුරිටි සර්විස්
6. SE-AR Cafe

පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි වී.ජී.සී.එන්. ගමගේ මහත්මිය රැස්වීම ආරම්භ කරමින් පැමිණ සිටි පිරිස පිළිගැනීමෙන් අනතුරුව සියලු ව්‍යාපෘති සඳහා පහත පොදු කරුණු පිළිබඳව සැලකිලිමත් විය යුතු බව දන්වන ලදි.

- ➢ ලංසු ලියවිලි වල සියලු කරුණු හොඳින් කියවා අධ්‍යනය කළ ලංසු ලියවිලි ඉදිරිපත් කළයුතු බව.
- ➢ ලංසු ඉදිරිපත් කිරීමේදී ඉල්ලා ඇති ලේඛණ අනුපිළිවෙලට අමුණා යොමු කළ යුතු බවත් අනවශ්‍ය ලේඛණ ලංසු ලියවිලි සමඟ ඉදිරිපත් කිරීමෙන් වැලකිය යුතු බව.
- ➢ ආරක්ෂක හා පවිත්‍රතා ලියවිලි වල සඳහන් සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිභාර අරමුදල් ගෙවන බවට කම්කරු කොමසාරිස් හෝ ප්‍රාදේශීය කම්කරු කොමසාරිස් විසින් නිකුත්කරන ලද වලංගු සහතිකයක් ප්‍රමාණවත් බවත් සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිභාර අරමුදල් ගෙවූ ලියවිලි ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන බව.
- ➢ ආරක්ෂක හා පවිත්‍රතා ලියවිලි වල ස්ථානීය පරීක්ෂාව ඉදිරිපත් කිරීමේදී අදාල ස්ථාන වෙන වෙනම පරීක්ෂා කර ස්ථාන හඳුනා ගැනීම සිදුකල යුතු බව.

- ගම්පහ උද්භිද උද්‍යානයේ ආරක්ෂක ලියවිලි වල ස්ථානීය පරීක්ෂාව සඳහා ගම්පහ උද්භිද උද්‍යානය, නාරාහේන්පිට සහකාර අධ්‍යක්ෂ කාර්යාලය හා පොදු රාජ්‍ය මණ්ඩලීය යුද සොහොන් වශයෙන් ස්ථාන 03ක් ඇති බවත් එම ස්ථාන වෙන වෙනම පරීක්ෂා කර බලා ස්ථානීය පරීක්ෂාව සිදුකල යුතු බවත්, මිලගණන් පත්‍රයෙහි ගම්පහ උද්භිද උද්‍යානයට අයත් මිලගණන් පමණක් සඳහන් කල යුතු බව.
- කාර්යසාධන ඇපකරය දෙපාර්තමේන්තුවේ තැන්පත් කරන්නේ නම් එහි ඡායා පිටපත ලංසු ලියවිලි සඳහා ඉදිරිපත් කළ යුතු අතර, වාණිජ බැංකුවකින් බැංකු ඇපකරයක් ඉදිරිපත් කරන්නේ නම් එහි මුල් පිටපත ලංසු ලියවිලි සමඟ ඉදිරිපත් කළ යුතු බව.
- ආරක්ෂක හා පවිත්‍රතා සේවා සැපයීමේදී ලංසු ලියවිලි වල ඉදිරිපත් කරන ද්‍රව්‍ය හා උපකරණ ලැයිස්තුව මාසිකව අනිවාර්යයෙන්ම සැපයිය යුතු බව.
- ලංසු ලේඛණ වල වර්ෂයේ සේවා සැපයිය යුතු දින ගණන පිළිබඳව සැලකිලිමත්වී ලංසු මිල ගණන් නිවැරදිව ගණනය කළ යුතු බව.
- මනා ගුණාත්මක සේවයක් ලබාදීම සඳහා ලංසු ඉදිරිපත් කළ යුතු බව

ආරක්ෂක ලියවිලි වල වගන්ති පහත පරිදි සංශෝධනය වියයුතු වේ.

<u>ලංසු කොන්දේසි පත්‍රයේ 24 වන වගන්තිය</u>

**සාමාන්‍ය අනතුරු සඳහා රක්ෂණාවරණය**

සැපයුම්කරු විසින් කොන්ත්‍රාත් කාලය ආවරණය වන පරිදි සාමාන්‍ය අනතුරු සඳහා පූර්ණ රක්ෂණාවරණයක් **හා** සැපයුම්කරුගේ ඔහුගේ/ ඇයගේ සේවකයන්ගේ, නියෝජිතයන්ගේ ක්‍රියාවක් හෝ විධානයක් හේතුවෙන් වන අලාභ හෝ හානි නිසා වන ඕනෑම අනතුරක් ආවරණය වන රක්ෂණාවරණයක්, තම වියදමින් ආරම්භ කර පවත්වා ගෙන යා යුතුය. තම කාර්ය මණ්ඩලයේ සුරක්ෂිතතාවයට අදාල ඇප හා රක්ෂණාවරණ ලබා ගැනීමේ පූර්ණ වගකීම සැපයුම්කරු සතු වේ. සැපයුම්කරු විසින් රක්ෂණ සහතිකය ගිවිසුම් අත්සන් කිරීමට ප්‍රථම අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

<u>ලංසු ආකෘති පත්‍රයේ 14 වගුව</u>

| විස්තරය | පැය 12ක සේවා මුරයකට සංඛ්‍යාව | ගාස්තු ප්‍රමාණය එක් සේවා මුරයකට (රු.) | දිනක වියදම (රු) |
|---|---|---|---|
| ප්‍රධාන ආරක්ෂක පරිපාලක නිලධාරි (පිරිමි) - දිවා සේවා මුරය (CSO) | 01 | | |
| ස්ථානභාර ආරක්ෂක නිලධාරි (පිරිමි) -දිවා සේවා මුරය (OIC) | 01 | | |
| ස්ථානභාර ආරක්ෂක නිලධාරි (පිරිමි) - රාත්‍රී සේවා මුරය (OIC) | 01 | | |
| ආරක්ෂක නියාමක (පිරිමි) - දිවා සේවා මුරය (JSO) | 09 | | |
| ආරක්ෂක නියාමක (පිරිමි) - රාත්‍රී සේවා මුරය (JSO) | 08 | | |
| ආරක්ෂක නියාමක (කාන්තා) (LSO) | 02 | | |
| **මුළු එකතුව (*)** | **22** | | |
| නිල ඇඳුම්, උපකරණ, ද්‍රව්‍ය හා මෙවලම් සඳහා වියදම (පැය 24 - දිනක වියදම සටහන් කරන්න) | | | |
| පරිපාලන වියදම් (පැය 24 -දිනක වියදම සටහන් කරන්න) | | | |
| වෙනත් වියදම් ........................................................ (පැය 24 - දිනක වියදම සටහන් කරන්න) | | | |
| වියදමේ මුළු එකතුව | | | |
| අඩු කිරීම් වේ නම් (පැය 24 -දිනක වට්ටම් සටහන් කරන්න) | | | |
| මුළු එකතුව (පැය 24 -දිනක මුළු වියදම සටහන් කරන්න) | | | |
| වාර්ෂක මුදල (රු.) (දින 366) | | | |
| වැට් බදු පවතී නම් (රු.) | | | |
| මුළු වාර්ෂික මුදල (රු.) | | | |

වැසිකිලි පවිත්‍රතා ලියවිලි වල සඳහන් වගන්ති පහත පරිදි සංශෝධනය වියයුතු වේ.

**<u>ලංසු කොන්දේසි පත්‍රයේ 27 වන වගන්තිය</u>**

**සාමාන්‍ය අනතුරු සඳහා රක්ෂණාවරණය**

සැපයුම්කරු විසින් කොන්ත්‍රාත් කාලය ආවරණය වන පරිදි සාමාන්‍ය අනතුරු සඳහා පූර්ණ රක්ෂණාවරණයක් **<u>හා</u>** සැපයුම්කරුගේ, ඔහුගේ/ඇයගේ සේවකයන්ගේ, නියෝජිතයන්ගේ ක්‍රියාවක් හෝ විධානයක් හේතුවෙන් වන අලාභ හෝ හානි නිසා වන ඕනෑම අනතුරක් ආවරණය වන රක්ෂණාවරණයක්, තම වියදමින් ආරම්භ කර පවත්වා ගෙන යා යුතු අතර රක්ෂණාවරණ සහතිකයේ පිටපතක් කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කරන අවස්ථාවේදී අධ්‍යක්ෂ ජනරාල් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත භාර දිය යුතුය. තම කාර්යය මණ්ඩලයේ සුරක්ෂිතතාවයට අදාල ඇප හා රක්ෂණාවරණ ලබාගැනීමේ පූර්ණ වගකීම සැපයුම්කරු සතු වේ.

ආපනශාලා ලියවිලි වල සඳහන් වගන්ති පහත පරිදි සංශෝධනය වියයුතු වේ.

<u>19 හි V වගන්තිය</u>

වෙළඳ නියෝජිත මහතුන්ගේ වාහන උද්‍යාන භූමියට ඇතුල් කිරීම සපුරා තහනම් වන අතර එසේ භාණ්ඩ ප්‍රවාහනය සඳහා වාහන ඇතුල් කිරීමට සිදුවන්නේ නම් ඒ සඳහා පූර්ව අනුමැතිය **<u>අදාල උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂගේ</u>** අනුමැතිය ලබාගත යුතු වන්නේය.

**<u>පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ කැෆටේරියා ආපනශාලාව</u>**

<u>ලංසු කොන්දේසි පත්‍රයෙහි 19 හි iii වගන්තිය</u>

කැෆටේරියා ආපන ශාලාව හා ආහාරපාන අලෙවි සැල සඳහා අවශ්‍ය භාණ්ඩ හා අනෙකුත් උපකරණ උද්‍යාන භූමිය තුලට ඇතුල් කිරීමට අවසර ඇත්තේ පෙ.ව. 7.00 සිට පෙ.ව. 10.00 දක්වා හා ප.ව.2.00 සිට **<u>ප.ව. 4.00</u>** දක්වා කාලය තුල පමණි. පෙ.ව. 10.00 සිට ප.ව. 2.00 දක්වා කාලය තුළ කිසිදු වාහනයක් උද්‍යාන භූමියට ඇතුල් කිරීම සපුරා තහනම් වේ.

කැෆටේරියා ආපන ශාලාවේ අමතර ආහාර පාන ආකෘති අංක 03 මඟින් ඉදිරිපත් කළ යුතු බවත් වෙනම ලේඛණයක බුෆේ සඳහා ලබාදෙන අයිතම හා මිල ගණන් ඉදිරිපත් කරන ලෙසත් දන්වන ලදි. ඒ අනුව එය අදාල ආයතනයේ ලිපි ශිර්ෂයක අත්සන්, නිල මුද්‍රා තබා ඉදිරිපත් කරන ලෙස **ලන්සුකරු** වැඩිදුරටත් දන්වන ලදි.

එමෙන්ම කැෆටේරියා ආපන ශාලාවේ පමණක් දිවා ආහාරය සඳහා සියලුම අයිතම වලට පැකට් කරන ලද හා නොකරන ලද මිල ගණන් වෙන වෙනම සඳහන් කරන ලෙස දන්වන ලදි. එය අනෙක් ආපන ශාලාවන්ට අදාල නොවන බව වැඩිදුරටත් දන්වන ලදි.

**<u>පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ කිරිහල</u>**

<u>ලංසු කොන්දේසි පත්‍රයෙහි 19 හි iii වගන්තිය</u>

කිරිහල සඳහා අවශ්‍ය භාණ්ඩ හා අනෙකුත් උපකරණ සැපයීම සඳහා වාහන උද්‍යාන ප්‍රධාන දොරටුව ඉදිරිපිට ගාල් කිරීමට අවසර ඇත්තේ පෙ.ව. 7.00 සිට පෙ.ව. 9.00 දක්වා හා ප.ව. 2.00 සිට **<u>ප.ව. 3.00</u>** දක්වා කාලය තුල පමණි. පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා හා **<u>ප.ව.3.00න්</u>** පසුව කිසිදු වාහනයක් උද්‍යාන ප්‍රධාන දොරටුව අසල ගාල් කිරීම සපුරා තහනම් වේ.

2023.11.20 දින පැවති පූර්ව ලංසු රැස්වීමේ සඳහන් ඉහත කරුණු නිවැරදි බව සහතික කරමි.

එච්.සී.පී.ජයවීර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

එච්.සී.පී. ජයවීර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
පේරාදෙණිය